රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක : 01/2011

මගේ අංකය : ඒ/1/07/2011
රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය,
අංක 177, නාවල පාර,
නාරාහේන්පිට,
කොළඹ 05.
2011 ජූනි මස 13 දින.

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන් සහ
දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත,

**18 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම**

18 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 55(3), 56(1) හා 57(1) වගන්ති කෙරෙහි ඔබගේ අවධානය යොමු කරවමි.

02. අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය සහිතව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් නැවත බලතල පැවරීමක් කරන තුරු, රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් දැනටමත් කර ඇති පහත සඳහන් බලතල පැවරීම් ප්‍රකාරව කටයුතු කළ යුතුය.

I. රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ බලතල පැවරීම සම්බන්ධයෙන් 2003 ජුලි මස 02 දාතමින් නිකුත් කර ඇති අංක : 1295/26 දරණ ගැසට් නිවේදනය.

II. රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ පරිපාලන කාර්යයන් පිළිබඳ බලතල පවරනු ලැබ ඇති 2003 සැප්තැම්බර් 12 දිනැති අංක : 01/03 දරණ රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛය.

III. පළාත් රාජ්‍ය සේවයේ තනතුරු දරණ අධ්‍යාපන පිරිස් සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා නිකුත් කර ඇති 2003.12.02 දිනැති රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 04/03 හා 2005.09.20 දිනැති රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 04/03 (1)

IV. රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ පරිපාලන කාර්යයන් පිළිබඳ බලතල පැවරීම සඳහා වූ 2009.04.03 දිනැති 01/2003(1) චක්‍රලේඛය.

03. රාජ්‍ය සේවා කොමිෂන් සභාව අක්‍රියව පැවැති කාලය තුළ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතියට යටත්ව ගෙන ඇති යම් තීරණයක් වේ නම් එම තීරණවලට පාදක කරගත් සියලු ලිපිලේඛන ද සමග රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කළ යුතුය.

04. ඉහත සඳහන් උපදෙස් වහාම ක්‍රියාත්මක වන පරිදි පිළිපදින ලෙස සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්, පළාත් සභා ප්‍රධාන ලේකම් වරුන් සහ දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත නියම කරනු ලැබේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

එන්.ආරියදාස කුරේ
ලේකම් (වැ.බ.)
රාජ්‍ය සේවා කොමිෂන් සභාව

පිටපත් : - 1. ජනාධිපති ලේකම්.
2. අග්‍රාමාත්‍ය ලේකම්.
3. අමාත්‍ය මණ්ඩල ලේකම්.